**බ්‍රිතාන්‍ය රජය මූල්‍ය සහය භාවිතයෙන් ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතිය (එක්සත් රාජධානිය යකඩ පාලම් ව්‍යාපෘතිය-අදියර -1) 2014**

---

බ්‍රිතාන්‍ය රජය මූල්‍ය සහය භාවිතයෙන් ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතියේ (එක්සත් රාජධානිය යකඩ පාලම් ව්‍යාපෘතිය-අදියර -1) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික අධිවේගී මාර්ගවල යකඩ පාලම් ඉදිකිරීම සඳහා සීමාසහිත හොන්කොන් සහ ෂැන්හයි බැංකු සහයෝගීතා පොදු සමාගම සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2007 නොවැම්බර් 16 දින එළඹි අංක 53 එම්/එෆ්සී 1207 (2007027/එස්එල්) දරන ණය ගිවිසුමේ අංක 1 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය, මහා මාර්ග සහ නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ මහා මාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

(අ) ග්‍රාමීය පාලම් 222 ක් සැලසුම් කිරීම,මැණුම් කිරීම හා සැපයීම,

(ආ) පාලම් රැඳවීම හා සවි කිරීම සඳහා උපාංග සැපයීම

(ඇ) හදිසි අවශ්‍යතා සඳහා එක් මං තීරු පාලම් ලබා දීම සහ

(ඈ) පාලම් රැඳවීම හා සවි කිරීම සම්බන්ධයෙන් වසර 4 කට වැඩි කාලයක් එක්සත් රාජධානියේ තාක්ෂණික සහාය සහ පුහුණුව ලබාදීම මගින් මාර්ග යටිතල පහසුකම් පුළුල් කිරීම සහ සවි බල ගැන්වීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,784 ක් වූ අතර සහ ඉන් රු.මිලියන 11,284 කට සමාන එක්සත් රාජධානි පවුම් මිලියන 50 ක් සීමාසහිත හොන්කොන් සහ ෂැන්හායි බැංකු සහයෝගීතා පොදු සමාගම විසින් ලබාදීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2008 ජනවාරි 23 දින ආරම්භ කළ අතර 2012 ජනවාරි 22 දින අවසන් කිරීමට නියමිත විය. කෙසේ වෙතත් ව්‍යාපෘතිය එහි කටයුතු 2014 දෙසැම්බර් 31 දක්වාම අඛණ්ඩව පවත්වාගෙන ගොස් තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය**

---

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

---

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 ට අනුව මෙහෙයුම්, මූල්‍ය හා ආයෝජන ක්‍රියාකාරකම් පැහැදිලිව වෙන් වෙන්ව පෙන්නුම් කරන ලෙස සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කර නොතිබුණි.

## 3. මුල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

## 3.1 අරමුදල් උපයෝජනය

------------------------

මූල්‍යනය, සමාලෝචිත වර්ෂය තුළදී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 දිනට |
| | එ.රා.පවුම් මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ණයදෙන නියෝජිතායතනය | 50.0 | 11,284.0 | - | - | 16,173.6 |
| ශ්‍රී.ලං.ර | 46.5 | 10,500.0 | 39.0 | 55.7 | 8,046.7 |
| | 96.5 | 21,784.0 | 39.0 | 55.7 | 24,220.3 |

## 3.2 භෞතික ප්‍රගතිය

-------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැපයුම්කරුගේ එකඟතාවය හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව 2007 සිට 2010 දක්වා කාලය තුළ අවස්ථා අටකදී මූලික කොන්ත්‍රාත්තුව වරින් වර සංශෝධනය කර තිබුණි. එම නිසා, දික් මීටර 5,563 ක දිගක් සහිත සීරු මාරු කළ හැකි පාලම් 222 ක් දික් මීටර 4,672 ක දිගක් සහිත පාලම් 169 ක් දක්වා අඩු කර තිබුණි. තවද, දික් මීටර 1,484 ක දිගක් සහිත නව ගුවන් පාලම් පහක්ද එකතු කර තිබුණි. කොන්ත්‍රාත් වැඩවල මූලික විෂය පථය මෙසේ නිරන්තරයෙන් වෙනස් වීමේ ප්‍රතිඵලයක් ලෙස පාලම් ඉදිකිරීම් සඳහා නිශ්චිත පිහිටීම, දිග, පළල සහ ප්‍රමුඛතාවය හඳුනාගැනීමට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය අසමත් වී තිබුණි. එම පාලම්වල මූලික සැලසුම්ද වෙනස් කර තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික කාර්යසාධනය පහත දී ඇති වගුවෙන් පැහැදිලි කෙරේ.

| පාලම් වර්ගය | පාලම් ගණන | | ඉදි කරන ලද පාලම් ගණන | | |
|---|---|---|---|---|---|
| | සැපයීමට එකග වූ | සැපයන ලද | ස්ථිර | තාවකාලික | කෙරීගෙන යන වැඩ |
| ගුවන් පාලම් | 5 | 5 | 5 | - | - |
| ක්ෂණික පාලම් | 59 | 59 | 52 | - | - |
| සී-200 පාලම් | 67 | 67 | *100 | 7 | 1 |
| ඩෙල්ටා පාලම් | 4 | 4 | 4 | - | - |
| ඇට්ලස් පාලම් | 6 | 6 | 6 | - | - |

* සී 200 පාලම් සීරු මාරු කළ හැකි පාලම් වන අතර කළින් ඉලක්ක ගත පාලම් ප්‍රමාණයට වඩා ඉදිකර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) මාර්ගයේ ඉදිකිරීම් වැඩ අතහැර දැමූ නිසා, 2009 සහ 2010 දී ත්‍රිකුණාමලය පිටත වට රවුම් මාර්ගයේ රු.මිලියන 3,495 ක පිරිවැයකට ඉදිකළ පාලම් 08 ක් භාවිතා නොකර පැවතුන බව නිරීක්ෂණය විය.

(ආ) 2011 සහ 2012 දී නිම කිරීමට සැලසුම් ගත කර තිබුණද පාලම් 10 ක ඉදිකිරීම් වැඩ රු. මිලියන 36.53 ක පිරිවැයකට 2014 දී සම්පූර්ණ කර තිබුණි. ප්‍රමාණවත් සාධාරණ හේතු දැක්වීමකින් තොරව ව්‍යාපෘතිය කාලය දීර්ඝ කිරීම් කිහිපයකට අවසර ලබා දී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රමාද ගාස්තු සාධාරණ ලෙස නිශ්චය කර නොතිබුණි.

(ඇ) ගලදෙණිය අපලදෙණිය මාර්ගයේ පාලමක් ඉදිකිරීමට 2010 අප්‍රේල් 08 සහ 2010 අගෝස්තු 16 කුලියාපිටිය මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාලයට රු. මිලියන 78.19 ක් වටිනා යකඩ පාලම් සංරචක බාරදී තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, වසර 5 ක් අවසන් වූවද පාලමේ ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කර නොතිබුණි.